**රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථසාධක සංගමය - 2015**

---

රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථසාධක සංගමයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන,රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථසාධක සංගමය ආඥා පනතේ (283 අධිකාරය) සහ 1983 අංක 18 දරන රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථසාධක සංගම් පනතේ 18 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සංගමයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටී සැලසුම් කිරීම පිණිස සංගමයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංගමයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදය දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය සේවා අන්‍යොන්‍යාධාර අර්ථසාධක සංගමයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

2015 දෙසැම්බර් 31 දිනට සංගමය වෙත ලැබී තිබුණු විවිධ ආදායම් හා වෙනත් ලැබීම් රු.1,771,823 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීම වෙනුවට ජංගම නොවන වගකීම් ලෙස දක්වා තිබුණි.

#### 2.2.2 අවිනිශ්චිත ගිණුම්

දීර්ඝ කාලයක් තිස්සේ ජංගම වත්කම් යටතේ පවතින අවිනිශ්චිත ගිණුම් ශේෂය වූ රු. 1,713,575 ක් නිරවුල් කර ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම ශේෂය සමාලෝචිත වර්ෂය තුළදී රු.972,728 කින් වර්ධනය වීම හේතුවෙන් ආයතනයේ ගිණුම් පොත්වල නිරවද්‍යතාවය තහවුරු කරගැනීමට නොහැකි විය.

### 2.3 නීතිරීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම

පහත දැක්වෙන නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1891 අංක 05 දරන රාජ්‍ය සේවා අන්‍යොන්‍යාධාර අර්ථසාධක සංගමයේ ව්‍යවස්ථාව 16 (1), (2) සහ (3) වගන්තිය | සමාලෝචිත වර්ෂයේදී යතුරු පැදි මිලදී ගැනීම සඳහා අළුතින් හඳුන්වා දී තිබුණු රු. 850,000 ක ණය මුදලට හා පශ්චාත් උපාධි සඳහා වූ රු.300,000 ක ණය මුදලට අදාළ රීති සහ තවත් ණය වර්ග හයක ණය මුදලේ සීමාව වැඩි කිරීමට අදාල රීති ගැසට් පත්‍රයේ පළකර නොතිබුණි. |
| (ආ) රාජ්‍ය සේවා අන්‍යොන්‍යාධාර අර්ථසාධක සංගමයේ සංශෝධිත ව්‍යවස්ථාව | |
| (i) 10 (1) වගන්තිය | සාමාජිකයෙකුගේ මරණය දැනුම්දී මාස දෙකක් ඇතුලත ඔහුට හිමි ප්‍රදානය ගෙවිය යුතු වුවත්, විගණනයට ඉදිරිපත් කර තිබූ 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මරණ ප්‍රදාන පිළිබඳ වාර්තාවට අනුව ඉකුත් වර්ෂය හා ඊට පෙර වර්ෂවල මිය ගිය 30 දෙනෙක් සඳහා ගෙවිය යුතු රු.1,425,000 ක මරණ ප්‍රදාන මුදල් සමාලෝචිත වර්ෂය අවසානයටත් ගෙවා නොතිබුණි. |

| | |
|---|---|
| (ii) II පරිච්ඡේදයේ 5 (I) වගන්තිය සහ 5 (II) වගන්තිය | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන පොලී ප්‍රමාණයට අනුකූලව පොලී ප්‍රමාණය වෙනස් කිරීමට පාලන කමිටුවට හැකියාව තිබූ නමුත් මහ බැංකු පොලී අනුපාතය පිළිබඳව සමාලෝචනය කිරීමකින් තොරව දේපල ණය සඳහා පොලී අයකරගෙන තිබුණි. |
| (iii) I වන පරිච්ඡේදයේ 7 (ආ) (i) වගන්තිය | ණය වාරික 6 කට වඩා හිඟ හිටි සාමාජිකයන් වෙනුවෙන් ව්‍යවස්ථානුකූලව ගත යුතු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංගමයේ මූල්‍ය ප්‍රතිඵලය රු.39,486,478 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.35,887,374 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,599,104 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සේවක පාරිශ්‍රමික වියදම් රු.2,109,136 කින් වැඩි වී තිබුණද පොලී ආදායම රු.4,023,416 කින් වැඩි වීම හා වෙනත් වියදම් රු.1,830,938 කින් අඩු වීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී මූල්‍ය ප්‍රතිඵලයේ අඛණ්ඩ වර්ධනයක් ඇති වී තිබුණි. සේවක පාරිශ්‍රමික, ආදායම් බදු හා ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේදී රු.49,811,927 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂයේදී රු.64,515,298 ක් දක්වා සියයට 30 කින් වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

**(අ) සංගමයේ යහපාලනයට පාලන කමිටුවල දායකත්වය සහ පාලන කමිටු රැස්වීම්වලට සාමාජිකයින්ගේ සහභාගිත්වය**

පවත්වා තිබුණු මාසික සහ විශේෂ පාලන කමිටු රැස්වීම් 30 කින් භාණ්ඩාගාරය නියෝජනය කළ නියෝජිතයින් දෙදෙනාගෙන් එක් අයෙකු රැස්වීම් 09 කටත් අනෙක් නියෝජිතයා රැස්වීම් 16 කටත් සහභාගී වී නොතිබුණු අතර මාසික පාලන කමිටු, අතිරේක පාලන කමිටු සහ අනුකමිටුවලට පත්වූ සමහර සාමාජිකයින් එම කමිටුවලට ප්‍රමාණවත් පරිදි සහභාගී වී නොතිබුණි. මෙම තත්ත්වය අනුව සංගමයේ අභිවෘද්ධිය සඳහා තීරණ ගැනීමේදී ඇතැම් කමිටු සාමාජිකයින්ගෙන් ප්‍රමාණවත් දායකත්වයක් සංගමයට ලැබී නොතිබුණි.

**(ආ) සාමාජිකත්වය**

2011 දෙසැම්බර් 31 දිනට 10,982 ක් වූ සාමාජික සංඛ්‍යාව 2015 දෙසැම්බර් 31 දින වන විට 11,887 ක් දක්වා වැඩි වී තිබුණු අතර 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා නව සාමාජිකයන් 2,356 ක් පමණක් බඳවා ගෙන තිබුණි. රාජ්‍ය සේවයට අළුතින් එක් වූ පිරිස සැලකියයුතු පරිදි වැඩිවී තිබුණු නමුත් සංගමයේ සාමාජිකත්වය වර්ධනය කර ගැනීම සඳහා ප්‍රමාණාත්මක හා විධිමත් වූ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**(ඇ) සංවත්සර රැස්වීම් වලට සාමාජිකයින්ගේ පැමිණීම**

------------------------------------------------------

ඉකුත් වර්ෂ 5 තුල සංවත්සර මහා සභා රැස්වීම්වලට සහභාගී වූ සාමාජිකයින් සමස්ථ සාමාජිකයින්ගෙන් ආසන්න වශයෙන් සියයට 13 ක් පමණක් විය. සංගමයේ පාලක සභාවට සාමාජිකයින් තෝරා ගැනීම, සංවත්සර මහා සභාවේදී ඡන්ද විමසීමකින් සිදු කිරීම සහ සංවත්සර රැස්වීමේ යෝජනා සඳහා දායකත්වය ලබාදීම සාමාජිකයින් වැඩි පිරිසකගේ නියෝජනය මත සිදු වී නොතිබුණි. එමෙන්ම සංගමයේ අභිවෘද්ධිය සඳහා තීරණ ගැනීම පාලක සභාවේ වගකීම වන බැවින් පාලක සභාව තෝරා පත්කර ගැනීම වැඩි පිරිසකගේ සහභාගිත්වයෙන් සිදුකර ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි.

**(ඈ) සාමාජිකයින් පිළිබඳ සමීක්ෂණයක් පවත්වා නොතිබීම**

------------------------------------------------------------

සංගමයේ සාමාජිකයින්ගේ ජීව දත්ත පිළිබඳව සමීක්ෂණයක් කිරීම මගින් සාමාජිකයින් සම්බන්ධයෙන් ගිණුම්වල දිගුකාලීනව නිරවුල් නොවී පවතින ශේෂ (මරණ ප්‍රදාන හිමිකම,ණය, දායක මුදල්) නිරවුල් කර ගැනීමට සහ සාමාජිකයාගේ පැවැත්ම පිළිබඳ විස්තර (මිය යෑම,පදිංචිය වෙනස් වීම,විදේශගත වීම, සාමාජිකත්වය අහෝසි වීම) රැස්කරගත හැකි වුවත් එවැනි සමීක්ෂණයක් සිදුකිරීමට සංගමයේ අවධානය යොමුකර නොතිබුණි.

**4.2 මූල්‍ය, ණය හා ඉතුරුම් කළමණාකරණයේ දුර්වලතා**

------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ණය පොලී හා දායක මුදල් ගෙවීම් පැහැර හැර ඇති සාමාජිකයින් 42 ක් ද, දායක මුදල් පමණක් ගෙවීම් පැහැර හැර ඇති සාමාජිකයින් 112 ක්ද , ප්‍රදානමික මුදල් ගෙවා නොතිබුණු සාමාජිකයින් 39 ක්ද විය.

(ආ) සංගමයේ ව්‍යවස්ථාවේ රීති අංක 7 ආ (1) ට අනුව සංගමයට අයවිය යුතු යම් මුදලක් එය ගෙවිය යුතු දින සිට මාස 06 ක කාල සීමාවක් තුල නොගෙවීම නිසා සාමාජිකත්වය අහෝසි වේ. එසේ සාමාජිකත්වය අහෝසි වූ 22 කගෙන් ණය පොලී සහ දායක මුදල් වශයෙන් රු.105,270 ක් ද, හිඟ හිටි දායක මුදල් වශයෙන් රු.279,065 ක් ද අයවිය යුතුව පැවතුණි. එම මුදල් අයවීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි .

(ඇ) පරිගණක පද්ධතියේ තොරතුරු අනුව ක්‍රියාකාරී සාමාජිකයන්ගෙන් අයනොවී පවතින ණය ශේෂය රු.458,357 ක් හා මියගිය සාමාජිකයින් 10 දෙනෙකුගේ හිඟහිටි ණය ශේෂ වල එකතුව රු.722,906 ක් වන අතර එම ණය ශේෂ අයකර ගැනීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.3 අවිධිමත් ගණුදෙනු**

---------------------

අනුරාධපුර කටුකැලියාව නිවාඩු නිකේතනයක් ඉදිකිරීම සඳහා රු.27,660,111 මුදලකට කොන්ත්‍රාත්තුවක් ලබා දී තිබුණි. විගණනය සඳහා ඉදිරිපත් වූ තොරතුරු අනුව අමතර වැඩ වල වටිනාකම රු.12,747,735 කි. එනම් මුල් ගිවිසුම්ගත කොන්ත්‍රාත් මුදලින් සියයට 46 කි. මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමට අතිරේකව මුල් ඉදිකිරීමේ කාර්යය සමඟ සම්බන්ධතාවයක් නොමැති වෙනත් ඉදිකිරීම් කටයුතු "අමතර වැඩ" ලෙස යථෝක්ත කොන්ත්‍රාත්කරු වෙතම ඔහුගේ මිල ගණන් වලට ඉටුකිරීමට පවරා තිබුණි. මෙම කාර්යයන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර අවම මිලට ඉටු කර ගැනීමට හැකියාව තිබියදී සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරා නොගැනීම නිසා සංගමයට අවාසිදායක තත්ත්වයක් ඇති වී තිබුණි.

## 4.4 අරමුදල් ඌන උපයෝජනය

සංගමයේ බැංකු ජංගම ගිණුම් 02 ක සමාලෝචිත වර්ෂයේ ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා අඛණ්ඩව රු.මිලියන 10 ඉක්ම වූ බැංකු ශේෂ පැවති අතර එය ප්‍රශස්ත ආයෝජනයක නොයෙදවීම හේතුවෙන් ලබාගත හැකිව තිබූ අතිරේක ආදායමක් සංගමයට අහිමි වී තිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංගමයේ බිම් මහලේ වර්ග අඩි 3300 ක ඉඩ ප්‍රමාණය මාස 08 ක කාලයක සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණු අතර වෙනත් පාර්ශවයකට කුලියට ලබා දීමට හෝ කටයුතු නොකර නිෂ්කාර්යව පැවතුණි.

(ආ) සංගමය විසින් 2013 වර්ෂයේදී බිම්මහලේ ඉඩකඩ වලින් කොටසක් බාහිර ආයතනයකට කුලියට ලබා දී තිබුණු අතර එම ආයතනය සංගමයේ ගොඩනැගිල්ලෙන් ඉවත් වී අවුරුදු 02 මාස 03 ක් ගත වී තිබුණත් රු. 127,000 ක හිඟ කුලිය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 ක්‍රියාකාරි සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුව සංගමය විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත සංඛ්‍යා හා තථ්‍ය සංඛ්‍යා අතර විෂයයන් 43 ක් සම්බන්ධයෙන් සියයට 10 සිට සියයට 130 දක්වා වූ සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින් වර සංගමයේ ඒකාබද්ධ ලේකම් සහ භාණ්ඩාගාරිකගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පාලන ක්ෂේත්‍රය | දුර්වලතාවය කෙටියෙන් |
|---|---|---|
| (අ) | පරිගණක පද්ධතිය | පරිගණක තොරතුරු නිවැරදි නොවීම<br>සාමාජික ණය හා තැන්පතු වාර්තා කිරීමේ දුර්වලතාවයන් හා සාමාජික තොරතුරු පරිගණකගතව නොතිබීම |
| (ආ) | මරණ ප්‍රදාන ක්‍රමය | මරණ ප්‍රදාන ගෙවීමේ ප්‍රමාදය |
| (ඇ) | සාමාජික ණය | සංගමයේ සාමාජිකයින් වෙත ණය ලබාදීම වර්ධනය කරවීම වෙනුවට ස්ථාවර තැන්පතු වෙත යොමු වීමෙන් අපේක්ෂිත සුභසාධනය ඉටු නොවීම |